# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2015 අප්‍රේල් මස 07 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.33 ට සභාව රැස්විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉසුර දේවප්‍රිය
උදය ප්‍රභාත් ගම්මන්පිල
උදාර රත්නායක
උදේන විජේරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. ලාල්කාන්ත
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නලින්ද ජයතිස්ස
නව්සර් ෆව්සි
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වනිගරත්න
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
සහන් ප්‍රදීප්
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අසෝක රන්වල
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
ආනන්ද රංජිත් රූපසිංහ
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උපාලි ගුණරත්න
එස්.එම්. මරික්කාර්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එඩ්වඩ් ගුණසේකර
එස්. කුහවරදන්
කවින්ද හේෂාන් ජයවර්ධන
කේ.ඩී. අරුණ දීපාල්
ගුණසිරි ජයනාත්
ජගත් පී. විතාන
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
පී.ඩී. අබේරත්න
මනෝ ගනේෂන්
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මොහොමඩ් ෆයිරූස්
රජිත හපුආරච්චිගේ
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සලෝචන ගමගේ
සුමිත්ලාල් මැන්දිස්

## 01. කාරක සභා වාර්තා :

2015.03.18 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව, 2015.02.09 වන දින පැවති පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව, 2015.02.02, 2015.03.03, 2015.03.04 හා 2015.03.10 දිනවල පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තා ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා.09.42 ට උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී. පසුවද, ගණපූරණය ඇති නොවූ බැවින්,***
***පූ.භා. 09.45 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 09.58 ට යළිත් රැස්විය.***

## 02. නොපැමිණ සිටීමේ අවසරය :

*"ඉන්දික මහීෂ බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

***පූ.භා. 10.30 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.30 ට යළිත් රැස්විය.***

## 03. පළාත් සභාවේ කටයුතු :

රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"කාර්යපටිපාටි රීති අංක 57 හි කෙසේ සඳහන් වුවද, 2015.03.18 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී කිනම් තීරණයකට එළැඹියද, ඒ කිසිත් නොතකා අද දින සභා රැස්වීම විසිර යෑමෙන් අනතුරුව එළැඹෙන මීළඟ සභා රැස්වීම රැස්වන දිනය තීරණය කිරීම සඳහා මතු දැක්වෙන යෝජනාව ඉදිරිපත් කිරීමට මෙම පළාත් සභාව අවසර අපේක්ෂා කරනු ලබයි."*

*ඊට සභාව එකඟ වූයෙන්,*

## 04. පළාත් සභාවේ රැස්වීම :

රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් පහත සඳහන් එම යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා කල් දැමිය නොහැකි ඉක්මණින් කළ යුතු කාර්යයන් ලෙස සැලකෙන බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක... දරන බදු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ ඉදිරි වැඩ කටයුතු නිම කිරීමේ අවශ්‍යතාවය පැන නැඟී ඇති හෙයින්ද, ඊට ගරු මන්ත්‍රීතුමන්ලාට ප්‍රමාණවත් කාලයක් ලබා දීමේ අටියෙන්ද ඉදිරියේදී එළැඹෙන උත්සව සමයේදී විය හැකි සන්නිවේදන සහ සමාජ කටයුතු අවම කර ගැනීමේ අපේක්ෂාවෙන්ද අද දින 2015.04.07 වන දින විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2015 අප්‍රේල් මස 28 වන දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු අතර, 2015 අප්‍රේල් මස 21 වන දින සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 05. රීති අංක 107 යටතේ යෝජනාව :

ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද මතු සඳහන් වන යෝජනාවන් සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 06. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව I: බස්නාහිර පළාත් සභාවේ සහකාර හැන්සාඩ් සංස්කාරක තනතුරට හා හැන්සාඩ් වාර්තාකරු/ලඝු ලේඛක තනතුරට 06/2006 චක්‍රලේඛයෙන් සිදු වූ අසාධාරණය වෙනුවෙන් සහනයක් ඉල්ලීම.

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"බස්නාහිර පළාත් සභාවේ හැන්සාඩ් වාර්තාව සකස් කරන්නේ සභා ලේකම් කාර්යාලයේ හැන්සාඩ් අංශයයි. පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුකූලව එකී වාර්තාව සකස් කරන නිලධාරීන් හතර දෙනාගේ තනතුරු සම්බන්ධයෙන් බලවත් අසාධාරණයක් 06/2006 චක්‍රලේඛය නිසා සිදු වී ඇත.*

*දීමනා රහිතව වසර 13 ක කාලයක් තිස්සේ හැන්සාඩ් සංස්කාරකගේ රාජකාරී කටයුතු ආවරණය කරමින් රාජකාරී කරන සහකාර හැන්සාඩ් සංස්කාරක තනතුරට විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් තිබියදී මෙතෙක් උසස්වීම් නොදී කළමනාකරණ සහකාර සේවයේ වැටුප් තලවල පිහිටුවා ඇත.*

*වසර 10 කට අධික කාලයක් තිස්සේ සේවයේ නියුතු ස්ථිර හැන්සාඩ් වාර්තාකාරිණියන් තිදෙනාගේ තනතුරුද නිසි පරිදි 06/2006 චක්‍රලේඛය ප්‍රකාරව අන්තර්ග්‍රහණය නොකොට කම්කරු ශ්‍රේණියේ වැටුප් තලයක පිහිටුවා ඇති අතර මෙතෙක් කිසිදු උසස්වීමක් ලබා දී නැත.*

*මේ නිසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලත් බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව සහකාර හැන්සාඩ් සංස්කාරක නිලධාරියාටත් 06/2006 චක්‍රලේඛය අනුව හැන්සාඩ් වාර්තාකාරිනියන් තිදෙනාටත් සිදු වූ අසාධාරණය ඉවත් කොට සාධාරණයක් ඉටු කරන මෙන් ගරු ආණ්ඩුකාරතුමාගෙන්ද, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්ද, මධ්‍යම රජයේ ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමාගෙන්ද හා ගරු පළාත් සභා අමාත්‍යතුමාගෙන්ද මෙම ගරු සභාව ඉල්ලා සිටින්නීය."*

## 07. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව II: 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවේදී හැකි ඉක්මණින් සම්මත කර ගන්නා මෙන් රජයට යෝජනා කිරීම.

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"ජනතාවට ඉදිරිපත් කළ දින සියයේ වැඩ සටහන ප්‍රකාර, දැනට පවත්නා අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ වූ විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් ස්ථාපිත කිරීම හා 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන අහෝසි කර, සියලු කොමිෂන් සභා නැවත බලාත්මක කර ඉදිරිපත් කරන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන*

*කෙටුම්පත පාර්ලිමේන්තුවේදී හැකි ඉක්මණින් සම්මත කර ගත යුතු යැයි මෙම පළාත් සභාව රජයට යෝජනා කර සිටියි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 12.55 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 08. පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව : මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/13 දරන හා 2014.01.20 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුනු, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාව, 2015.03.03 දින පැවති ප්‍රඥප්ති හා නීති කාරක සභා වාර්තාවේ සංශෝධනයන්ට යටත්ව එකී අතුරු ව්‍යවස්ථාව සම්මත කළ යුතු යැයි ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.*

## 09. කල් තැබීම :

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 03.03 ට, 2015 අප්‍රේල් මස 28 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.04.07
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/07
Minuts 2015.04.07 - Hansard Section